C 374 BAN

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

# වතු පාසල් වල කළමනාකරණ ක්‍රියාවලිය අධ්‍යාපනික සංවර්ධනයට බලපා ඇති අන්දම පිළිබඳව නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු පාසල් ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්

# A study of the impact of the Management Process in Estate Schools on Educational Development with special reference to Estate Schools in Nuwaraeliya District

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපන විද්‍යා අංශයේ දර්ශනපති (අධ්‍යාපන) දැ අවුරුදු පර්යේෂණ උපාධියේ අවශ්‍යතා අර්ධ වශයෙන් පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධයයි.

අධ්‍යයන වර්ෂය : 1994/96

නිබන්ධක : එල්. ජී. එච්. බණ්ඩාර

ලියා පදිංචි අංකය : GS/M.Phil/94-96/548

නිබන්ධ උපදේශක : මහාචාර්ය ආර්. ජී. ලියනගේ
අංශාධිපති
අධ්‍යාපන විද්‍යා අංශය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය. 1997.07.10

543442

## සාරාංශය

මෙම පර්යේෂණ ප්‍රයත්නය අධ්‍යාපන දර්ශනපති උපාධියේ පර්යේෂණ අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි. මෙයින් උනන්දු වන්නේ වතුපාසල් කළමනාකරණ භූමිකාව හඳුනාගෙන එය කුමන ආකාරයකින් වතුපාසල් සිසුන්ගේ අධ්‍යාපනික සංවර්ධනයට දායකව ක්‍රියාත්මක වන්නේ ද යන්න හඳුනා ගැනීමටය.

1. පරිච්ඡේදය තුලින් ඉදිරිපත් කරනුයේ වතුප්‍රදේශවල වතු කම්කරු ජීවන රටාව සරලව විස්තර කිරීමටය. එහෙත් ඔවුන්ගේ සමාජ ආර්ථිකය , සෞඛ්‍යය , වතු කළමනාකරණයේ ස්වභාවය, වෘත්තිය සංවිධාන ආදිය සොයා බැලීමට සැලකිලිමත් වී ඇත. තවද වතුපාසල් සම්බන්ධව වර්තමානයේ පවත්නා කළමනාකරන රටාව ගැන පර්යේෂණයක යෙදීමේ අවශ්‍යතාව හෙළි කිරීමටද උනන්දු වේ. සැබැවින්ම වතුපාසල් කළමනාකරණ භූමිකාව පර්යේෂණයට ලක් කිරීමේ වැදගත්කම හා අවශ්‍යතාව අවධාරණය කර ඇත.

2. පරිච්ඡේදය වතු කම්කරුවන් දකුණු ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ අන්දම පැහැදිලි කිරීමටත්, ඔවුන් ශ්‍රී ලාංකික පුරවැසි භාවය ලබා මෙරට පදිංචි වීම පිළිබඳ විස්තරාත්මකව කරුණු සාකච්ඡා කෙරේ. තවද මෙම ජන කොටස සඳහා පැවැති අධ්‍යාපන රටාවත්, එහි සම්ප්‍රදායනුත් කෙරෙහි අවධානය යොමු කරමින් මෙම අධ්‍යාපන ක්‍රමය ශතවර්ෂ දෙකක කාලයක් තුල සංවර්ධනය වූ අන්දම ගැඹුරින් හදාරා ඇත.

3. පරිච්ඡේදය පර්යේෂණ සංකල්පය පිළිබඳ අර්ථ විග්‍රහයක යෙදේ. කළමනාකරණය , සාධනය , යන සංකල්ප දෙක ශිෂ්‍ය සාධනයට බලපෑම සම්බන්ධයෙන් පැවතිය හැකි අදාළ බව පිළිබඳ කරුණු විභාග කර තිබේ. එමෙන්ම පාසල් කළමනාකරණය, ශිෂ්‍ය සාධනය යන ද්විත්ව -

සංකල්ප තුළ ඇති සහසම්බන්ධතාවයද පරීක්ෂණයට භාජනය කර තිබේ. මෙම ශාස්ත්‍රීය පර්යේෂණයේදී ඇලන් හා ඔඩ්ඩ්‍රි ප්‍රේසි ඉදිරිපත් කළ පාසල් කළමනාකරණ සංකල්පයට අනුව එහි වතුපාසල් සම්බන්ධයෙන් පවතින උපයෝගීතාවය හඳුනාගෙන තිබේ.

4. පරිච්ඡේදය වතුපාසල් සම්බන්ධ පෙර සාහිත්‍යය විමර්ශණය සඳහා වෙන් වී ඇත. ඉන්දියානු වතු කම්කරු අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙතෙක් සිදු කර ඇති පර්යේෂණයන් හඳුනාගෙන තිබේ. එහිදී දේශීය වශයෙන් සිදුකළ අධ්‍යාපනික පර්යේෂණ මෙන්ම ඉන්දියානු සංක්‍රමණික කම්කරුවන් පදිංචි වී ඇති මැලේසියාව, ඉන්දුනීසියාව, සිංගප්පූරුව අප්‍රිකාව ආදී රටවල සිදුකළ පර්යේෂණ ගැන ද විමසීමක යෙදී ඇත. එයින් නො නැවතී පාසල් කළමනාකරණය අධ්‍යාපනික සංවර්ධනයට බලපා ඇති අන්දම පිළිබඳව පාසල් කළමනාකරණයේ විවිධ කළමනාකරණ ව්‍යවහාර යන් මෙහිදී අවධානයට ලක් කර තිබේ.

5. පරිච්ඡේදය පර්යේෂණ ක්‍රම ශිල්ප හා පර්යේෂණයේදී උපයෝගී කරගත් උපකරණ ගැන පැහැදිලි කෙරේ. තෝරාගත් නියැදිය වතුපාසල්වල සාධන ක්‍රියාවලියේ සංවර්ධනයට උපයෝගී කරගනු ලැබිය හැකි කළමනාකරණ ව්‍යවහාරයන් හඳුනා ගැනීමට මෙම පර්යේෂණ ක්‍රම ශිල්ප හා උපකරණ භාවිත කර ඇත. ප්‍රත්‍යයන අධ්‍යයන ක්‍රමයක්, තොරතුරු විස්තර කිරීමේ අරමුණ ඇතිව විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයක් යන ක්‍රම දෙක උපයෝගී කර ගැනුනි. ඉහත ක්‍රම ශිල්ප ආශ්‍රිතව පර්යේෂණය දියත් කොට තිබේ. මෙම ශාස්ත්‍රානුකූල රටාව ගොඩනඟා ඇත්තේ පහත දැක්වෙන පර්යේෂණ ප්‍රශ්ණවලට පිළිතුරු ලබාගැනීම සඳහාය.

1. අධ්‍යාපනික සංවර්ධනය උදෙසා අනුගමනය කරන පාසල් කළමනාකරණ ව්‍යවහාර මොනවාද
2. අදාළ කළමනාකරණ ව්‍යවහාරයන් භාවිතයට ගැනීම උදෙසා කළමනාකරුවන් උපයෝගී කරගත් ක්‍රියාවලිය කුමක්ද

3. මෙසේ භාවිතයට ගැනීම පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ සංවර්ධනයට කවර ආකාරයකින් වලදායී වී තිබේද යන තරුණ අධ්‍යයනය සඳහාය.

[illegible] එපමණක් නොව තෝරාගත් නියැදිය තුල ඉහතින් හඳුනාගත් ශාස්ත්‍රානුකූල රටාව පර්යේෂණයේ අභිමතාර්ථ ඉටු කර ගැනීමට ප්‍රායෝගිකරණය කිරීමයි. එමගින්,

1. භෞතික පහසුකම් සැපයීමට අදාළ කළමනාකරණ ව්‍යවහාර
2. පාසල් සමාජ වාතාවරණයට සම්බන්ධ කළමනාකරණ ව්‍යවහාර
3. කළමනාකරණ කුශලතාවට අදාළ කළමනාකරණ ව්‍යවහාර
4. ගුරු මණ්ඩල ව්‍යුහය හා කාර්යය පැවරුමට අදාල කළමනාකරණ ව්‍යවහාර

යන චතුර්විධ අවශ්‍යතා

හඳුනා ගැනීමට හැකිවන පරිදි වතුපාසල් පැතිකඩ තුල පර්යේෂණය දියත් කෙරේ. මූලික කළමනාකරණ ව්‍යවහාර වතුපාසල්වල කළමනාකරණ ක්ෂේත්‍ර හරහා පුළුල්ව පර්යේෂණය මෙහෙයවීම සිදු කොට ඇත.

6. පරිච්ඡේදය තෝරාගත් එක් කළමනාකරණ ව්‍යවහාරයක් වන භෞතික සම්පත් කළමනාකරණය සඳහා වෙන් කෙරේ. පර්යේෂණ නියැදිය තුල භෞතික සම්පත් කළමනාකරණ ව්‍යවහාරය ක්‍රියාත්මකව පවතින අන්දමත් එය ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන සංවර්ධනයට අදාළ වන ස්වරූපයත් විස්තර කොට තිබේ. මෙහිදී භෞතික සම්පත් ලබා ගන්නා අන්දම පිළිබඳව තොරතුරු සම්මුඛ සාකච්ඡා හා වාර්තා වලින් ද එම සම්පත් භාවිතයට ගැනීම පිළිබඳ ක්‍රියාමාර්ග නිරීක්ෂණයන් මාර්ගයෙන් ද හඳුනාගෙන ඇත. මෙම ස්වරූපයන් දෙක පිළිබඳව ලබාගත් තොරතුරු ගැන සලකා එය අධ්‍යාපනික සංවර්ධනයට බලපාන ඇති තරම ප්‍රශ්නාවලිය තුලින් ගුරුවරුන්ගෙන් ලබාගත් ප්‍රතිචාර වලට අනුව නිගමනය කොට ඇත. මේ අනුව සමස්ථ පරිච්ඡේදය පුරාම විහිදී යනුයේ වතුපාසල්වල භෞතික සම්පත් අධ්‍යාපනික සංවර්ධනයට බලපෑමේ තරම පිළිබඳ අනාවරණයන්ය.

7. පරිච්ඡේදය යොමු වී ඇත්තේ වතුපාසල් සමාජ වාතාවරණය පිළිබඳ හෙළිදරව් කර ගැනීම් පිණිසය. මෙහිදී ද ඉහත ඉදිරිපත් කළ ශාස්ත්‍රානුකූල පර්යේෂණ රටාව අනුගමනය කර ඇත. මේ අනුව වතුපාසල් අභ්‍යන්තරව හා බාහිරව පවත්නා සමාජ වාතාවරණ - කළමනාකරණ ක්ෂේත්‍රය එහි අධ්‍යාපනික සංවර්ධනය දායකවීම පිළිබඳව ප්‍රමාණාත්මක කරුණු සංඛ්‍යාත්මක දත්ත විග්‍රහය ඇසුරින් අනාවරණය කරගෙන ඇත.

8. පරිච්ඡේදය පුරාම දිවෙන්නේ කළමනාකරණ කුශලතා ව්‍යවහාරය වතුපාසල්වල අධ්‍යාපනික සංවර්ධනයට දායකවීමේ ප්‍රමාණයන් මැන බැලීමටය. මෙහිදී ද ඉහත සාධකය සම්බන්ධ වතුපාසල්වල වර්තමාන තත්වය ප්‍රමාණිත මිනුමකට භාජනය කොට අනාවරණයන් එළි දක්වා තිබේ.

9. පරිච්ඡේදය ගුරු මණ්ඩල ව්‍යුහය හා කාර්යය පැවරුමේ ඵලදායිතා ස්වරූපය වතු අධ්‍යාපනික සංවර්ධනය අදාළව පවතින අනාවරණ යන් ගෙන එනු ලැබේ. මෙහිදී ද මුලින් හඳුනාගත් පර්යේෂණ ව්‍යවහාරය අනුගමනය කරමින් ඉදිරිපත් කළ විශේෂිත ප්‍රශ්නවලට ලබාගත් අනාවරණ හෙළි කෙරේ.

10. පරිච්ඡේදය අවසාන පරිච්ඡේදය වන්නේය. මෙහිදී වතු පාසල්වල තෝරාගත් කළමනාකරණ ව්‍යවහාරයෙන් සම්බන්ධයෙන් පවතින නිගමනයන් හා පවත්නා තත්වයට ඉදිරිපත් කළ හැකි යෝජනා සඳහන් කෙරේ. මෙම යෝජනා දෙආකාරයකින් දක්වා ඇත. එනම්, සමස්ථ වතුපාසල් කළමනාකරණ ක්ෂේත්‍රයේ සිදුකළ යුතු නවීකරණයන් හා තෝරාගත් කළමනාකරණ ව්‍යවහාරයන් සම්බන්ධ ප්‍රතිසංස්කරණයන් වශයෙනි.